# මල්බර වසන්තයේ මා දුටු ජපානය 03

**විමලා විජේවර්ධන**
**කැන්ස්, ක්වීන්ස්ලන්තය.**

පෞරාණික නගරයක් වූ "කියාටෝ" (kyto) නැරඹීම අපගේ ඊළඟ චාරිකාව විය. කිලෝ 350 පමණ යායුතු ගමනට ජපන් භාෂාවෙන් "Shinkansen" යන නමින් ද, ඉංග්‍රිසි භාෂාවෙන් බුලට් (bullet train) නමින් ප්‍රසිද්ධ වූ අධිවේගී දුම්රිය යොදා ගතිමු. අප නිවහනට ආසන්නව පිහිටි Mishima මිෂිමා දුම්රිය පොලෙන් ගමන ඇරඹීමු. උදය කාලයෙහි දැකිය හැකි කලබලකාරී ගතිය දුම්රිය පොලෙහි විද්‍යාමාන විය. මා ජපානයේ ගත කළ සුළු කාලය ඇතුළත එම ජාතිකයන් ගේ විවිධ ගතිගුණ, ක්‍රියාකාරකම් හා හැසිරීම් රටාවන් මගේ සිත ගත්තේ ය. ටෝකියෝ වැනි ජනාකීර්ණ නගරයක පවා මහ මඟ හෝ ජනයා ගැවෙසෙන ප්‍රසිද්ධ ස්ථානවල කුණු කසල තබා බිම වැටුන කඩදාසි කැබැල්ලක් වත් නොදුටුවෙමි. අප ගමන් ගත් බස් රථයෙහි සෑම ආසනයක්ම ඉදිරිපිට අපද්‍රව්‍ය බහාලීම කුඩා බෑග් එකක් ඇත. ගමන අවසන් වූ පසු අප යා යුත්තේ එම අපද්‍රව්‍ය මල්ල බසයෙහි අති සුවිසල් භාජනයට දැමීමෙන් පසුවය. විනීත ආචාරශීලිබව සේවය අකුරටම ක්‍රමවත්ව ඉටු කිරීම ඔවුන්ගේ ජීවන සංකල්පය විය. මිෂිමා දුම්රියපොලෙහි, විවිධ නිළ ඇඳුම් වලින් වලින් සැරසුනු සේවක සේවිකාවෝ, කඩිසරව තම රාජකයීයන් ඉටු කරති. ඒ අතරතුර, මගින්ගේ ඕනෑ එපාකම් සිනහා මුහුණින් යුතුව ඉටු කරති. මා ඇතුළුව අප කණ්ඩයමේ බොහෝ දෙනෙකුගේ ප්‍රථම අත්දැකීමකි මෙම බුලට් දුම්රියෙහි ගමන ඒ නිසා කාතුළත් තිබුණේ ඉමහත් උද්යෝගයක්. පවනට බඳු වේගයෙන් හමා යන දුම්රිය රැසක් දුම්රිය වේදිකාවේ සිටි අප මවිතයට පත් කළේය. කාර්ය බහුල උදේ සවස මෙවැනි දුම්රිය රැසක්, ප්‍රධාන මාගර හරහා ගමන් කරයි.

1964 දී ජපන් ජාතිකයා තම අධිතීක්ෂණ ඥානය මෙහෙයවා පැයට කි.මී.320 ක වේගයෙන් යා හැකි මෙම අධිවේගී දුම්රිය සේවය ලොවට ඉදිරිපත් කළේය. මෙම " අධිවේගී අසහාය වීරයා" එතෙක් පැවති වේගවත් දුමුරිය සේවාවන් පරාජය කිරීමට සමත් විය. එම දුම්රිය ගමන් කළ හැකි වූයේ (ෂින්කාසෙන්) "shinkansen" නමින් හැඳින්වූ විශේෂ දුම්රිය මාගීයක පමණි.

එම මාර්ගයෙහිම පමණක් ගමන් මෙම දුම්රිය ජපන් ජාතිකයන් අතර ප්‍රකට වූයේ "ෂින්කාන්සෙන්" යන නමිනි. ඉංග්‍රිසි භාෂාවෙහි සුලභ ව්‍යාවහාරයෙහි ඕනෑම වේගවත් දෙයක් හදුන්වන්නේ බුලට් (Bullet) යන වචනයෙනි. එම නිසා මෙම අධිවේගී දුම්රිය ඉංග්‍රිසි බසින් bullet- train විය. කෙසේ වූවක් මෙහි නිල නාමය "ෂින්කාසෙන්ය"

ජපානය අධිජනගහනයෙන් යුත් රටකි. ප්‍රධාන නගර වන ඔසාකා, ටෝකියෝ පිහිටා ඇත්තේ එකිනෙකට සෑහෙන දුරකිනි. මෙම නගර දෙක අතර මිලියන පනහකට ආසන්න ජනකායක් වෙසෙති. සම්ප්‍රදයනූකූල දුම්රියකින් හෝ වාහනයකට ඒ ගමනට පැය 6ක් පමණ ගතවූවත් ෂින්කාසෙන් මඟින් එය පැය 2 1/2 වැනි සුළු වෙලාවකින් කළ හැක. ටෝකියෝ දුම්රිය පොළෙන් දිනකට මිලියනකට ආසන්න ජනතාවක් එහෙ මෙහෙ ගමන් කරති. මෙම ජනතාවට ඉක්මනින් පහසුවෙන් යාහැකි ගමනාගමන මාධ්‍යක තිබු අවශ්‍යතාවය ෂින්කාන්සෙන් අතින් සිදුවිය. මැදිරි 16 කින් පමණ යුක්ත වූ මෙම ඇතැම් දුම්රියකට දහසකට කිට්ටු වන මගින් ප්‍රමාණයක් එකවර යා හැකිවිය. ප්‍රධාන නගර අතර සම්බන්ධතාවය ඉක්මන් විය. වාණාජ හා ව්‍යාපාර කටයුතු නගර අතර ශීඝයෙන් සිදු විය. ජපානයේ ආර්ථිකය වේගවත්ම නැගී සිටියේය.

අධි වේගයෙන් ගියත්, "ෂින්කාන්සෙන්" ආරක්ෂාව අතින්ද ලෝක වාර්තා පිහිටුවා ඇත. ජපානයේ නිතරම භූමි කම්පා සුලි සුලං අධික හිම පතන ආදියම ගොදුරු වෙයි. ෂින්කාන්සෙන් දුම්රිය වැඩි වශයෙන් ගමන් කරන්නේ මෙම භූමිකම්පා වලට ගොදුරු වෙන ප්‍රදේශ අතරය. මෙතෙක් කල් එවැනි කිසිම ආපදවකට මෙම අධිවේගී දුම්රිය මුහුණ නොපෑවේය.

2011 දී ජපානයේ ඇතිවූ මහාභූමි කම්පාවෙන් දහස් ගණන් ජනතාව මිය ගියේ ය. නමුත් කිසිම ෂින්කාන්සෙන් දුම්රියකට හානි සිදු නොවීය. ජපන් ජාතිකයන්ගේ අධිතාක්ෂණ ඥානය අනුව ක්‍රියාත්මක වන ටෝකියෝහි ඇති ෂින්කාන්සෙන් ප්‍රධාන මැදිරියට සෑම දුම්රියක් ම සම්බන්ධ කොට ඇත. දුම්රිය ගමන් කරන ස්ථානය එහි වේගය ආදි සියල්ලම පාලක මැදිරියෙහි දර්ශනය වෙයි. එම නිසා හදිසි අවස්ථාවක දි, හෝ ආපදවක දී දුම්රිය නැවැත්වීමේ හැකියාවක් පාලක මැදිරියට ඇත. දුම්රියෙහි "බ්රේක්" ඉබේම එවිට වැඩ කරයි. දුම්රිය නැවතේ. මෙම අධිවේගී දුම්රියෙහි ප්‍රමාද වීම් දක්නට නැත. නියමිත වෙලාවට පැමිණේ. යම් හෙයකින් ප්‍රමාද වූවහොත් එය මිනිත්තුවකටත් වඩා අඩු කාලයකි.

අප යායුතු දුම්රිය නියම වෙලාවට පැමිණියේය. දුම්රියට නැගීමද ක්‍රමානුකූලව සිදුවේ. දුම්රිය ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් මැදිරි අංකවලට අනුරූප දෙරටු රැසකි. අපගේ ප්‍රවේශ පත්‍රයෙහි ඇති මැදිරි අංකය සඳහන් දෙරටු ව ඉදිරිපිට නැවතුණි. කලබලයකින් තොරව මැදිරියට ඇතුළු වීමු. අපට නියමිත ආසන වල වාඩිවී සුළු මොහොතකින් දුම්රිය ක්‍රියාත්මක විය. ඉතා සුළු වෙලාවකින් නියමිත වේගයට අවතීර්ණ විය. අපේ ගතට කිසිම වෙනසක් නොදැනුනි. වේගයෙන් ගියත් අවට පරිසරය මැනවින් නැරඹීය හැකි විය. පැය 1 1/2 වැනි සුළු වෙලාවකින් අපි කියෝටෝ වලට ලඟා වීමු.

> **සකුරා මල් පිපිලා - හරී පුදුමයි ගේ දොරකඩ නිල් වන පියසේ**

1865 දී ජපානයේ අගනුවර ටෝකියෝ බවට පත්වීම දක්වා අගනුවර කියාටෝ (kyto) විය. අවුරුදු 1000කටත් වඩා පැරණි ඉතිහාසයක් ඇති මෙය එකල ජපන් අධිරාජයාගේ රාජධානිය විය. එමනිසා මෙම නගරයෙහි පැරණි රාජ පරම්පරාවන්ට අයත් මාලිගා, සුවිසල් ගොඩනැගිලි මෙන්ම සාම්ප්‍රදායික පැරණි ක්‍රමයට අයත් ලීයෙන් තැනු නිවාස, උයන්වතු, පූජනීය ස්ථාන රැසක් දක්නට තිබුණි. ටෝකියෝ ජපානයේ වාණිජ හා ව්‍යාපාර මධ්‍යස්ථානය බවට පත් වෙද්දී කියෝටෝව "සංස්කෘතික පුරවරයක්" බවට පත්විය. ජපන් සංස්කෘතියට සුවිශේෂ වූ "ගේශ්‍යා ලඳුන්ගේ" නිජ බිම කියෝටෝවය. මෙම ගේශ්‍යා ලඳුන්, ජපන් සංස්කෘතියට ආවේණික වූ නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙහි මනා නිපුණත්වයක් ලැබු ඒ සඳහාම තම ජීවිතය කැප කිරීමට කැමතිම කාන්තාවන් පිරිසකි. උත්සව සභා භෝජන සංග්‍රහ, ආදියට පැමිණෙන අමුත්තන් නැටුමෙන්, ගැයුමෙන් හා වාදයෙන් මෙන්ම ඔවුන් සමඟ සතුටු සාමීචියේද යෙදීමෙන් ඔවුන් සතුට පත්කිරීම මොවුන්ගේ ප්‍රධාන කාර්යක් විය. ආදී කාලින ජපන් සමාජයෙහි, මෙම ගේශ්‍යා ලදුන්ගේ සේවය බොහෝ දුරට ප්‍රභූ සමාජයට සීමා විය. නමුත් එය සමාජයේ විවිධ කොටස් කරා ගමන් කර ඇත. සංචාරක ව්‍යාපාරයේ ද ගේශ්‍යා ලදුන්ගේ දර්ශනයන් ප්‍රමුඛ ස්ථානයක් ගනි. අපි කියාටෝ වලදී සම්ප්‍රදයික භෝජනාගාරයකට ගියෙමු. පාවහන් ගලවා ඔවුන්ගේ විශේෂ පාවහන් දැමීමට සිදුවිය. සම්ප්‍රදයානූකූලව ජපන් ක්‍රමයට පිළියෙල කල විවිධ ආහාර පාන එහි විය. ආහාර ගැනීමෙන් පසුව ගේශ්‍යා ලඳකගේ නැටුම්, ගැයුම් නැරඹීමත් ඇය සමඟ කථා කිරීමටත් අවස්ථාව ලැබුනි. සම්ප්‍රදයානූකූල කිමෝනාවකින් සැරසුනු ඇයගේ මුහුණ සහ බෙල්ල අවට ප්‍රදේශය සුදු පාටින් ආලේප කර තිබුණු අතර දෙතොල් තද රතු පැහැ ගැන්විය. හිස කෙස් උඩට උස්ව සිටින පරිදි අමුතු හැඩයකට සුවිසල් බවක් පෙනෙන ආකාරයට පිළියෙළ කර තිබුනි. මෙම සුවිසල් මෝස්තරය හවරියකින් තොරව ඇගේම කෙස් කළඹින් කළ බව ඇය පැවසීය. වයස අවුරුදු පහළොව පමණ කාලයේ දී පමණ, ගේශ්‍යා ලඳුන් පුහුණු කරන නිවාසවලට පැමිණෙන තරුණියන් ම ශිල්පී කටයුතු ප්‍රගුණ කිරීම, ගේශ්‍යා පාළිකාවන්ගේ කාර්යය භාර්ය විය. දැඩි විනය නීති රීති රැසකට යටත්ව මනා හික්මීමකින් යුතුව ශිල්ප හැදෑරිය යුතුය. නැටුම්, ගැයුම් පමණක් නොව ජපානයේ පවත්නා සම්ප්‍රදයික "තේ පැන් සංග්‍රහ උත්සව (Tea-Ceramony) ඉකිබානා වැනි මල් සැරසිලි ආදිය ගැනද දැනුමත් ලබාගත යුතුවිය. අවසානයේ දී ඇය අප ඇසු ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් විවාහයෙන් පසු මෙම සේවයෙන් ඉවත් විය යුතු බවත් පැවසීය. එම නිසා වයස අවුරුදු විසි පහ වනවිට, බොහෝ දෙනා මෙම සේවය නිමකරන බව පැවසීය.

"දහසක් පූජස්ථාන හෙබි නගරය" යනුවෙන් සමහරු කියෝටෝ හඳුන්වති. ඒ තරමටම පූජනීය ස්ථාන රැසක් නගරය වටා ඇත. අවුරුදු 1000 ක් පමණ පැරණි නගරයක් නිසා, ඉපැරණි යුගයට අයත් පූජනීය ස්ථානද මේ අතර ඇත. මුළු ජපන් ජනගහනයෙන් 80% පමණ, ජපන් ආදි වාසීන්ගෙන් පැවත එන "ෂින්ටෝ" (shin-to) ධර්මය අදහති. ක්‍රි:ව 6 වන සියවසේදී මහායාන බුද්ධාගම ජපානයට පැමිණියේ ය. "සෙන් බුදුදහම" යනුවෙන් හදුන්වන මෙම ධර්මය අදහන ජපන් ජාතිකයෝ රැසකි. බොහෝ දුරට ඔවුන්ගේ ඇදහිලි රටාව, මෙම ආගම් දෙකෙහිම මිශ්‍රණයකි. ආගම ජපන් ජාතිකයාගේ ජීවිතය සමග තදින් බැඳී නැත. ඔවුන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථාවලදී ආගමික චාරිත්‍ර, වත් පිළිවෙත් අනුගමනය කරති. විවාහ මංගල්‍ය කටයුතු පූජනීය ස්ථානවල සම්ප්‍රදයනුකුල කටයුතු වලින් පසු තමන් කැමති පරිදි ඔවුහු විශේෂ උත්සව පවත්වති. ළමයෙකු ඉපදුණු පසු, තම පවුලේ අය සමඟ පූජනීය ස්ථානයකට අවුත් 'සෙත් පැතිම්' කරන අයුරු අපි කිහිප විටෙක දැක්කෙමු. අවමංගල්‍ය කටයුතු වලදී

26 වන පිටට

